NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 11 ශ්‍රේණිය | නර්තනය | 3.1 ඒකකය |
|---|---|---|

## බෙර සරඹ වාදනය කරමු.

- **හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. බෙර සරඹ වාදනයේ දී මුලින්ම ............... වැයීමට පුහුණු විය යුතුය.
(1). මාත්‍රා (2). අක්ෂර (3). පද (4). කස්තිරම්

02. ගැටබෙරයේ ............... දෙකකි.
(1). වරපට (2). සුරත්තට්ටු (3). ඇස් (4). බෙර ලණු

03. බීජාක්ෂර හා ............... යනුවෙන් බෙර වාදනයේ දී අක්ෂර ප්‍රභේද දෙකකි.
(1). ගර්භාක්ෂර (2). මාත්‍රාක්ෂර (3). ගාත්‍රාක්ෂර (4). ප්‍රාණාක්ෂර

04. වම් ඇසෙන් ............... අක්ෂරය වාදනය කරයි.
(1). ජිත් (2). කුං (3). නං (4). තත්

05. සුරත්තට්ටුව භාවිත කරනුයේ ගැටබෙරයේ ............... ඇසට ය.
(1). දකුණු (2). වම් (3). ඉදිරි (4). පිටුපස

(ලකුණු 2×5 = 10)

- **හිස්තැනට ගැළපෙන පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

01. .............................. යන අක්ෂරය වාදනයේ දී බෙරයේ වම් පස ගැටිය අසල ඇඟලි තුඩුවලින් වැයිය යුතුය.
02. පළමුවන බෙර සරඹය ........................................ යනුවෙන් දැක්විය හැකිය.
03. ''දිත්'' යන අක්ෂරය ........................................ බෙරයෙන් වාදනය කරනු ලැබේ.
04. ........................................ සබරගමු සම්ප්‍රදායේ ප්‍රධානම වාද්‍ය භාණ්ඩය යි.
05. පහතරට බෙරයේ බෙර කඳ ........................................ හැඩයෙන් යුක්ත ය. (ලකුණු 2×5 = 10)

- **පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. ගැටබෙරයෙන් වාදනය කරන බීජාක්ෂර මොනවාද?
02. ගර්භාක්ෂර සතර නම් කරන්න.
03. දෙවොල් බෙරයෙන් වාදනය කරන බීජාක්ෂර ලියන්න.
04. දවුල වාදනය කිරීමේ දී ගනු ලබන උපකරණය කුමක්ද? එය භාවිතා කරන්නේ දවුලේ කුමන ඇසටද?
05. දෙවොල් බෙරයේ දකුණු ඇස හඳුන්වන තවත් නමක් සඳහන් කරන්න.

(ලකුණු 4×5 = 20)

06. ගැටබෙරයක රූප සටහනක් ඇඳ කොටස් 5ක් නම් කරන්න. (ලකුණු 10)